# ජාතික යෞවන සම්මාන තරගාවලිය සහ ජාතික යෞවන සම්මාන උළෙල - 2024

ජාතික තරුණ සේවා සභාව මගින් වාර්ෂිකව සංවිධානය කොට පවත්වනු ලබන ජාතික යෞවන සම්මාන තරගාවලිය සහ යෞවන සම්මාන උළෙල මෙවරද 44 වන වරටත් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

01. යෞවන සම්මාන තරගාවලියට අදාළ පොදු උපදෙස්

01.1 2024 යෞවන සම්මාන තරගාවලියේ තරග සඳහා ඉදිරිපත්විය හැකි වයස් සීමාව අවුරුදු 15 - 35 අතර වේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන **2024.08.15** වන දිනට අවුරුදු 15 - 35 ත් අතර වීම.( 1989.08.15 දිනට පසු හා 2009. 08.15 දිනට පෙර උපන් අය විය යුතුය).

01.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2024. 08.15 වේ.

01.3 ඒකල තරග පළාත් හා ජාතික මට්ටමින් පවත්වනු ලබන අතර සාහිත්‍ය තරග අංශ හා කණ්ඩායම් තරග ජාතික මට්ටමින් පමණක් පවත්වනු ලැබේ.

01.4 සෑම තරගකරුවෙක්ම පළාත් සහ ජාතික තරග සඳහා ඉදිරිපත් වීමේදී තම අනන්‍යතාවය සහ වයස සනාථ කළ යුතුය. ඒ සඳහා ජාතික හැඳුනුම්පත, ගුවන් ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය ඉදිරිපත් කල හැකි අතර එසේ නොමැති විට උප්පැන්න සහතිකයෙහි මුල් පිටපත සමග අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, විහාරාධිපති හෝ රජයේ පිළිගත් විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කරන ලද පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

01.5 කණ්ඩායම් තරග සඳහා ඕනෑම පළාතක් නියෝජනය කරමින් ඉදිරිපත් විය හැක. ඒකල තරග සඳහා ජාතික හැඳුනුම්පතේ පදිංචිය සඳහන් දිස්ත්‍රික්කයෙන් පමණක් තරගයට ඉදිරිපත් වීමට හැකියාව ඇත. කිසියම් තරගකරුවෙකු ඒකල තරග අංශ සඳහා හැඳුනුම්පතේ සඳහන් දිස්ත්‍රික්කයෙන් හැර වෙනත් දිස්ත්‍රික්කයකින් තරගයට ඉදිරිපත් වීමේදී එම දිස්ත්‍රික්කයේ පදිංචි බවට ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. නියමිත පරිදි පදිංචිය තහවුරු කිරීමට අපොහොසත් තරගකරුවන්ට කිසිම හේතුවක් මත තරගාවලියට ඉදිරිපත් වීමට අවස්ථාව නොලැබේ.

01.6 සම්මාන උළෙලෙන් පසුව වුවද කිසියම් වංචනික ක්‍රියාවක් කළ බවට ඔප්පු වුවහොත් සම්මාන සහතිකය අවලංගු කිරීම, ඉදිරි යෞවන සම්මාන තරග සහභාගිත්වය අවලංගු කිරීම ආදී ජාතික තරුණ සේවා සභාව ගනු ලබන තීරණයන්ට තරගකරුවන් අවනත විය යුතුය.

01.7 ජාතික තරුණ සේවා සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ කිසිවෙකුට මෙම තරගාවලිය සඳහා ඉදිරිපත් විය නොහැක.

01.8 තරග සඳහා වන ගැටළු වලදී අභියාචනා ඉදිරිපත් කිරීම හෝ විමසීම් කිරීම ඒකල තරගයක නම් අදාළ තරගකරුද කණ්ඩායම් තරගයක නම් කණ්ඩායම් නායකයා විසින් සිදු කළ යුතුය. බාහිර පාර්ශවයන්ට ඒ සඳහා මැදිහත් විය නොහැක.

01.9 තරගාවලිය සම්බන්ධ තොරතුරු සහ චක්‍රලේඛ උපදෙස් www.nysc.lk වෙබ් අඩවිය මගින් ලබා ගත හැකිය.

01.10 විමසීම් සෞන්දර්ය කුසලතා සංවර්ධන අංශය 0112850986 දිගුව 414/ 0112746601

02. යෞවන සම්මාන ජාතික තරගාවලිය

02.1 පළාත් මට්ටමින් පවත්වනු ලබන යෞවන සම්මාන තරගාවලියෙන් ප්‍රථම, දෙවන ස්ථාන ලබා ගන්නා තරුණ තරුණියන් සඳහා ජාතික මට්ටමේ තරග පැවැත්වෙන අතර ජයග්‍රාහකයින්ට සම්මාන ප්‍රදානය කිරීම ජාතික යෞවන සම්මාන උළෙලේදී සිදු කෙරේ.

02.2 යෞවන සම්මාන ජාතික තරග පැවැත්වෙන්නේ ජාතික තරුණ සේවා සභාව මගින් නියම කරනු ලබන දිනයන්හිදී පමනක් වන අතර එම දිනයන්හිදී තරගකරුවන් තරගය සඳහා සහභාගී විය යුතුය. නියමිත දිනට සහභාගී නොවන තරගකරුවන් සඳහා නැවත දිනකදී එම තරගය පැවැත්වීමට කටයුතු කරනු නොලැබේ.

03 <u>තරග අංශ පැවැත්වීම සඳහා පොදු තරග කොන්දේසි.</u>

03.1 **කාල පරාසය නොසලකා හරින නිර්මාණ විනිශ්චය සඳහා සලකා බලනු නොලැබේ.**

03.2 චිත්‍ර, ඡායාරූප, මූර්ති, කැටයම් හා සාහිත්‍ය තරග අංශ සඳහා ඉදිරිපත්වන තරගකරුවන්ට එක් තරග අංශයකින් උපරිම නිර්මාණ 03 ක් ඉදිරිපත් කළ හැකි අතර තරග අංශ කැමති සංඛ්‍යාවකට ඉදිරිපත් විය හැකිය.

04 <u>නර්ථන තරග සඳහා තරග කොන්දේසි</u>

04.1 සියළු නර්ථන තරග සඳහා සහය ගායනා සහ වාදන ශිල්පීන්ට වයස් සීමාව අදාල නොවන අතර ඒ සඳහා සාමාජිකයින් අවශ්‍යතාවය පරිදි යොදවා ගත හැකිය. සහය ගායන හා වාදන ශිල්පීන් සඳහා සහතිකපත්‍ර හෝ සම්මාන හිමි නොවේ.

04.2 සියළුම නැටුම් තරග අදාල රංග වස්ත්‍රාභරණයෙන් සැරසී ඉදිරිපත් කල යුතු අතර සහය බෙර වාදන ශිල්පීන් අදාල රංග වස්ත්‍රාභරණයෙන් සැරසී සිටිය යුතුය. පළාත් තරග වලදී පමනක් පෙරහුරු ඇඳුම් කට්ටලයෙන් සැරසී ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

04.3 ශාස්ත්‍රීය (උඩරට, පහතරට හා සබරගමු) නැටුම් වලට පටිගත කරන ලද සංගීතය භාවිතා කළ නොහැකි අතර නව නිර්මාණ, ජන නැටුම්, භරත හා කථක් නැටුම් සඳහා පටිගත කරන ලද සංගීතය අවශ්‍යතාවය අනුව භාවිතා කළ හැකිය.

04.4 <u>කණ්ඩායම් තරග සඳහා කණ්ඩායමක සාමාජිකයින් ගණන අවම 05 ක් හා උපරිම 12 ක් විය යුතු අතර කාන්තා, පිරිමි හෝ මිශ්‍ර කණ්ඩායම් ලෙස ඉදිරිපත් විය හැකිය. කාන්තා පිරිමි සම සමව ඇතුලත් වීම අවශ්‍ය නොවේ.</u>

05 <u>සංගීත තරග සඳහා තරග කොන්දේසි</u>

05.1 සියළු සංගීත තරග සඳහා සහය වාදන ශිල්පීන්ට වයස් සීමාව අදාල නොවන අතර ඒ සඳහා සාමාජිකයින් අවශ්‍යතාවය පරිදි යොදවා ගත හැකිය. සහය ගායන හා වාදන ශිල්පීන් සඳහා සහතිකපත්‍ර හෝ සම්මාන හිමි නොවේ.

05.2 සංගීත තරග අංශය සඳහා අවශ්‍ය වාදන භාණ්ඩ අදාල තරගකරුවන් විසින් සපයා ගත යුතුය.

05.3 තරග සඳහා ඉදිරිපත් වීමේදී සුදුසු ඇඳුමකින් සැරසී සිටිය යුතුය. (සහය ශිල්පීන්ද ඇතුළුව)

06 <u>යෞවන සම්මාන තරගාවලියේ පළාත් හා ජාතික මට්ටමින් පැවැත්වෙන තරග අංශ</u>

නර්තන තරග අංශ (ඒකල)

| | | |
|---|---|---|
| 01 | උඩරට නැටුම් (ශාස්ත්‍රීය)<br>ඒකල කාන්තා -<br>සළුගත් කථාව | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 02 | උඩරට නැටුම් (ශාස්ත්‍රීය)<br>ඒකල පිරිමි - දුනුමාලප්පුව | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 03 | පහතරට නැටුම් (ශාස්ත්‍රීය)<br>ඒකල කාන්තා -<br>රටයකුමේ නානුමුරය | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 04 | පහතරට නැටුම් (ශාස්ත්‍රීය)<br>ඒකල පිරිමි - ලිව්වවී | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |

| | | |
|---|---|---|
| 05 | සබරගමු නැටුම් (ශාස්ත්‍රීය) ඒකල කාන්තා - හලං පද සහිත සළඹ ශාන්තිය | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 06 | සබරගමු නැටුම් (ශාස්ත්‍රීය) ඒකල පිරිමි සේරමාන් මඩුපුරය | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 07 | භරත නැටුම් ඒකල කාන්තා - කවුත්තම් | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 08 | භරත නැටුම් ඒකල පිරිමි - කීර්තනම් | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 09 | කථක් නැටුම් ඒකල කාන්තා - තුම්රි | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 10 | කථක් නැටුම් ඒකල පිරිමි - භජන් | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 11 | උඩරට බෙර වාදනය ඒකල කාන්තා | • මගුල් බෙර පළමු හා දෙවන වට්ටම් ආශ්‍රයෙන් වාදනයක් හා මාත්‍රා තුනේ තනි තිතට අයත් අලංකාර බෙර පද සහිත වාදනයක්.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 12 | උඩරට බෙර වාදනය ඒකල පිරිමි | • මගුල් බෙර තුන්වන හා හතරවන වට්ටම් ආශ්‍රයෙන් මගුල් බෙර වාදනයක් හා අප්‍රචලිත තිත් වලට බෙර වාදනයක්.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 13 | පහතරට බෙර වාදනය ඒකල කාන්තා | • මගුල් බෙර පළමු හා දෙවන වට්ටම් ආශ්‍රයෙන් මගුල් බෙර වාදනය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 14 | පහතරට බෙර වාදනය ඒකල පිරිමි | • තිත් දෙකට අයත් තාලම් ගායනය, වාදනය, නර්තනය සමග ඉදිරිපත් කිරීම හා කියමන් සහිත මගුල් බෙර වාදනය ඉදිරිපත් කිරීම.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 15 | සබරගමු බෙර වාදනය ඒකල කාන්තා | • දෙසුළු මහ තුන් තිතට අයත් අඩව් ගමන් පද වාදනය සමග මගුල් බෙර වාදනය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 16 | සබරගමු බෙර වාදනය ඒකල පිරිමි | • මගුල් බෙර වාදනය හා විවිධ තිත්රූප වලට බෙර වාදනය ඉදිරිපත් කිරීම.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |

සංගීත තරග අංශ (ඒකල)

| | | |
|---|---|---|
| 17 | යොවුන් ගායනා - සිංහල | • පළාත් තරගයේදී ඕනෑම ජනප්‍රිය ගීතයක් ගායනා කිරීමට අවස්ථාව ලබා දීම.<br>• ජාතික තරගයේ දී නව පදමාලාවක් සංගීතවත් කොට නව නිර්මාණ ගීතයක් ඉදිරිපත් කළ යුතු අතර, විනිශ්චය මණ්ඩලය ලබා දෙන ගීතයක කොටසක්ද ගායනා කල යුතුය.<br>• මේ සදහා වාදක කණ්ඩායම උචිත පරිදි තමා විසින් සපයා ගත යුතුය.<br>• පටිගත කල සංගීතයද (music track) යොදා ගත හැකිය. |
| 18 | යොවුන් ගායනා - දමිළ | |
| 19 | යොවුන් ගායනා - ඉංග්‍රීසි | |
| 20 | ජන ගායනා (ඒකල කාන්තා) - සිංහල | • ආසාතාත්මක හා අනාසාතාත්මක වශයෙන් නාදමාලා ඇතුලත් වන සේ ගායනා කළ යුතුය.<br>• ඉදිරිපත් කිරීම ප්‍රාසාංගික විය යුතුය.<br>කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 21 | ජන ගායනා (ඒකල පිරිමි) - සිංහල | |

| | | |
|---|---|---|
| 22 | ජන ගායනා<br>(ඒකල කාන්තා) - දමිළ | • වෘත්තීන් ආශ්‍රිත ගායනා, ආගමික ගායනා හෝ විනෝදාස්වාදිත ගායනාවක් ඉදිරිපත් කළ යුතුය.<br>• ඉදිරිපත් කිරීම ප්‍රාසාංගික විය යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 23 | ජන ගායනා<br>(ඒකල පිරිමි) - දමිළ | |
| 24 | ශාස්ත්‍රීය ගායනා<br>උත්තර භාරතීය රාගධාරී<br>(ඒකල) | • ඉදිරිපත් කිරීම උත්තර භාරතීය රාගධාරී සංගීතය අනුව විය යුතුය.<br>• ශාස්ත්‍රීය ගායනයක ආකෘතිය මෙහිදී අනුගමනය කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 25 | ශාස්ත්‍රීය ගායනා<br>දක්ෂිණ භාරතීය රාගධාරී<br>(ඒකල) | • ඉදිරිපත් කිරීම දක්ෂිණ භාරතීය රාගධාරී සංගීතය අනුව විය යුතුය.<br>• ශාස්ත්‍රීය ගායනයක ආකෘතිය මෙහිදී අනුගමනය කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 26 | ශාස්ත්‍රීය වාදන උත්තර භාරතීය - තබ්ලා | • උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 27 | ශාස්ත්‍රීය වාදන උත්තර භාරතීය - වයලින් | • උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 28 | ශාස්ත්‍රීය වාදන උත්තර භාරතීය - සිතාර් | • උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 29 | ශාස්ත්‍රීය වාදන උත්තර භාරතීය - බටනලා | • උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 30 | ශාස්ත්‍රීය වාදන උත්තර භාරතීය - ගිටාර් | • උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 31 | ශාස්ත්‍රීය වාදන උත්තර භාරතීය - එස්රාජ් | • උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 32 | ශාස්ත්‍රීය වාදන උත්තර භාරතීය - හාර්මෝනියම් | • උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 33 | ශාස්ත්‍රීය වාදන දක්ෂිණ භාරතීය - මෘදංගම් | • දක්ෂිණ භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 34 | ශාස්ත්‍රීය වාදන දක්ෂිණ භාරතීය - තවිල් | • දක්ෂිණ භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 35 | ශාස්ත්‍රීය වාදන දක්ෂිණ භාරතීය - වයලින් | • දක්ෂිණ භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 36 | ශාස්ත්‍රීය වාදන දක්ෂිණ භාරතීය - බටනලා | • දක්ෂිණ භාරතීය රාගධාරී සංගීතයට අනුව ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 37 | බටහිර වාදනය - වයලින් | • බටහිර සංගීත ඛණ්ඩ ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 38 | බටහිර වාදනය - සැක්සෆෝන් | • බටහිර සංගීත ඛණ්ඩ ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 39 | බටහිර වාදනය - සින්තසයිසර්(keyboard) | • බටහිර සංගීත ඛණ්ඩ ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 40 | බටහිර වාදනය - ඩ්‍රම්ස් | • විවිධ රිද්ම රටා සහිත Drum Solo ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 41 | බටහිර වාදනය - පියානෝ | • බටහිර සංගීත ඛණ්ඩ ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 42 | බටහිර වාදනය - ක්ලැසික් ගිටාර් | • බටහිර සංගීත ඛණ්ඩ ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |

| | | |
|---|---|---|
| 43 | බටහිර වාදනය - ලීඩ් ගිටාර් | • බටහිර සංගීත බණ්ඩ ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 44 | බටහිර වාදනය - බේස් ගිටාර් | • බටහිර සංගීත බණ්ඩ ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 45 | බටහිර වාදනය - කොන්සට් ප්ලූට් | • බටහිර සංගීත බණ්ඩ ඉදිරිපත් කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |

වෙනත් තරග අංශ

| | | |
|---|---|---|
| 46 | නිවේදක - සිංහල | • මෙම තරග අංශයේදී එකී තරගකරුවන් එකිනෙකට වෙනස්වූ අවස්ථා කිහිපයක් නිවේදන කාර්යයෙහි යෙදිය යුතුය.<br>• ප්‍රවෘත්ති අංශය ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රවෘත්ති ප්‍රකාශය පිළිගත් ආකෘතියක සම්ප්‍රදාය ලෙස පිළි ගැනේ.<br>• ගුවන්විදුලි හෝ රූපවාහිනී වෙළඳ ප්‍රචාරක දැන්වීමක් ඉදිරිපත් කිරීම.<br>• බාහිර එළිමහන් හෝ ගෘහස්ත සංදර්ශණ අවස්ථාවක් කථනයේ යෙදීම.<br>• සජීවී විස්තර කථනයක යෙදීම/කැමති තේමාවක් ඔස්සේ සිදු කරන ඉදිරිපත් කිරීමක්.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 47 | නිවේදක - දමිළ | |
| 48 | නිවේදක - ඉංග්‍රීසි | |
| 49 | කථික - සිංහල | • තාරුණ්‍ය හා බැඳුනු වර්තමාන භාවිතාවන් මාතෘකා ලෙස තෝරා ගැනීම සංවිධායක හා විනිශ්චය මණ්ඩලයේ අභිමතය පරිදි සිදු කල යුතුය.<br>• මාතෘකා කිහිපයක් සකස් කර ඉන් එක මාතෘකාවක් තෝරා ගැනීමට තරගකරුවන්ට අවස්ථාව සලසා දිය යුතුය.<br>• කථික අවස්ථාවට විනාඩි 05 කට පෙර මාතෘකාව ලබා දීමට කටයුතු කළ යුතුය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 50 | කථික - දමිළ | |
| 51 | කථික - ඉංග්‍රීසි | |
| 52 | අභිරූපන රංගනය | • අභිරූපනයට අදාළ අංග රචනා හා රංගවස්ත්‍ර වලින් සැරසී නිර්මාණය ඉදිරිපත් කළ යුතුය.<br>• පටිගත කල හෝ නොකල සංගීතය භාවිතා කළ හැකිය.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 53 | චිත්‍ර - ප්‍රකාශන | • තෙල් සායම්, දිය සායම්, මිශ්‍ර මාධ්‍ය හෝ වෙනත් ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැකිය.<br>• ප්‍රමාණය අඟල් 17 X 24 |
| 54 | චිත්‍ර - මෝස්තර | • තෙල් සායම්, දිය සායම්, මිශ්‍ර මාධ්‍ය හෝ වෙනත් ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැකිය.<br>• ප්‍රමාණය අඟල් 17 X 24 |
| 55 | චිත්‍ර - සම්ප්‍රදායික | • තෙල් සායම්, දිය සායම්, මිශ්‍ර මාධ්‍ය හෝ වෙනත් ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැකිය.<br>• ප්‍රමාණය අඟල් 17 X 24<br>• සාම්ප්‍රදායික චිත්‍ර සඳහා ඔබ විසින් තෝරා ගන්නා සාම්ප්‍රදායික චිත්‍රයේ වර්ථමාන තත්වය සිතුවම් කිරීම අපේක්ෂිත අතර ඔබ සිතුවම් කරන මොහොතේ සිතුවමේ වර්ථමාන තත්වය දැක්වෙන ඡයාරූපයක්ද ඔබගේ නිර්මාණය සමග ඉදිරිපත් කළ යුතුය. |
| 56 | චිත්‍ර - ග්‍රැෆික් | • ග්‍රැෆික් චිත්‍ර තරගය සඳහා පරිගණක ආශ්‍රයෙන් නිර්මිත සිතුවම් පමනක් තරගයට අදාළ වේ. |
| 57 | මූර්ති | • දැව, ලෝහ හෝ පුළුස්සන ලද මැටි ආශ්‍රිත නිර්මාණ. |

| | | |
|---|---|---|
| 58 | කැටයම් | • දැව, ලෝහ හෝ පුළුස්සන ලද මැටි ආශ්‍රිත නිර්මාණ. |
| 59 | ඡායාරූප - වර්ණ | • ප්‍රමාණය අවම අඟල් 08 x 12 හා උපරිම අඟල් 16 x 20 |

<u>ආබාධ සහිත අයදුම්කරුවන්ගේ තරග</u>

| | | |
|---|---|---|
| 60 | යොවුන් ගායනා - සිංහල | • ඕනෑම ජනප්‍රිය ගීතයක් ගායනා කළ හැක.<br>• විනිශ්චය මණ්ඩලය ලබා දෙන ගීතයක කොටසක්ද ගායනා කල යුතුය.<br>• මේ සඳහා වාදක කණ්ඩායම උචිත පරිදි තමා විසින් සපයා ගත යුතුය.<br>• පටිගත කල සංගීතයද (music track) යොදා ගත හැකිය. |
| 61 | යොවුන් ගායනා - දමිළ | |
| 62 | නව නිර්මාණ නැටුම් ඒකල (මනස සෙමින් වැඩෙන) | • ඔබගේ නිර්මාණය පටිගත කළ හෝ නොකළ සංගීතය යොදා ගනිමින් සිදු කෙරෙන නවතම නිර්මාණාත්මක නර්තනාංගයක් විය යුතුය.<br>• ගීත භාවිතා කල නොහැක.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 63 | නව නිර්මාණ නැටුම් ඒකල (වෙනත් ආබාධ සහිත) | |
| 64 | චිත්‍ර - ප්‍රකාශන | • තෙල් සායම්, දිය සායම්, මිශ්‍ර මාධ්‍ය හෝ වෙනත් ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැකිය.<br>• ප්‍රමාණය අඟල් 17 X 24 |

09 <u>යෞවන සම්මාන තරගාවලියේ ජාතික මට්ටමින් පමනක් පැවැත්වෙන තරග අංශ</u>

නර්තන තරග අංශ (කණ්ඩායම්)

<u>(කණ්ඩායම් තරග සඳහා කණ්ඩායමක සාමාජිකයින් ගණන අවම 05 ක් හා උපරිම 12 ක් විය යුතු අතර කාන්තා, පිරිමි හෝ මිශ්‍ර කණ්ඩායම් ලෙස ඉදිරිපත් විය හැකිය. කාන්තා පිරිමි සම සමව ඇතුලත් වීම අවශ්‍ය නොවේ.)</u>

| | | |
|---|---|---|
| 65 | උඩරට නැටුම් (ශාස්ත්‍රීය) - දිවි දානය | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 66 | පහතරට නැටුම් (ශාස්ත්‍රීය) - නාථ මල් අස්න | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 67 | සබරගමු නැටුම් (ශාස්ත්‍රීය) – දේව කෝල් පාඩුව | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 68 | ජන නැටුම් - පතුරු | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 69 | ජන නැටුම් - ඔයිලාට්ටම් | • කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 70 | නව නිර්මාණ නැටුම් | • ඔබගේ නිර්මාණය පටිගත කළ හෝ නොකළ සංගීතය යොදා ගනිමින් සිදු කෙරෙන නවතම නිර්මාණාත්මක නර්තනාංගයක් විය යුතුය.<br>• ගීත භාවිතා කල නොහැක.<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |
| 71 | බෙර වාදන | • අවම වශයෙන් තාල රූප 3 ක් භාවිතා කල යුතුය.<br>• යම් කිසි තේමාවකට අනුව ඉදිරිපත් කල යුතුය.<br>• ආදේශ භාණ්ඩ භාවිතා කල හැකිය.(උපරිම සාමාජික සංඛ්‍යාව තුල ආදේශක භාණ්ඩ යොදා ගත හැක)<br>• කාලය අවම විනාඩි 05 උපරිම විනාඩි 07 අතර වේ. |

සංගීත තරග අංශ (කණ්ඩායම්)

| | | |
|---|---|---|
| 72 | කණ්ඩායම් සංගීතය (Band), ඩ්‍රම්ස්, තාල වාද්‍ය (Accustic) | • අවම ශිල්පීන් සංඛ්‍යාව 05 ක් හා උපරිම ශිල්පීන් සංඛ්‍යාව 10 කි.<br>• Acoustic Drum set යොදා ගත යුතුය.<br>• පූර්ව සකසා ගත් සංගීත ඛන්ඩ භාවිත කල නොහැක(Program Music)<br>• විද්‍යුත් උපකරණ යොදාගන්නේ නම් අදාළ හඩවල් පමණක් උපයෝගි කර ගත යුතු වේ.<br>• ගායන වාදන සහිත ගීත අංග 02 ක් ඉදිරිපත් කල යුතුය.<br>• එක් අංගයක් සදහා කාලය විනාඩි 03 ත් 05 ත් අතර විය යුතුය.<br>• දේශීය, විදේශීය ගීත යොදා ගත හැකිය.<br>• මුල් ගීතයේ තනුවට හානි නොවන පරිදි, ඊට උචිත ශිල්ප ක්‍රම යොදා ගනිමින්, නිර්මාණාත්මකව තම අංගය ඉදිරිපත් කලහැකිය<br>• ස්වර ප්‍රස්ථාර පිළිබදව අවබෝධය කෙරෙහි අවධානය යොමු කෙරේ. |
| 73 | වාද්‍ය වෘන්ද (OCHESTRA) | • අවම ශිල්පීන් ප්‍රමාණය 25ත් උපරිම ශිල්පීන් 35 අතර විය යුතුය.<br>• Acoustic Drum set යොදා ගත යුතුය.<br>• පූර්ව සකසාගත් සංගීත ඛන්ඩ භාවිතා කල නොහැක.(Program Music)<br>• විද්‍යුත් උපකරණ යොදාගන්නේ නම් අදාළ හඩවල් පමණක් යොදාග යුතු වේ.<br>• දේශිය, විදේශීය ගී හෝ ප්‍රසිද්ධ වාදන ඛන්ඩ (music pieces) භාවිතා කරමින් වාදන අංග ඉදිරිපත් කල යුතුය.<br>• එක් වාදන අංගයක් සදහා කාලය විනාඩි 05 ත් 08 ත් අතර විය යුතුය.<br>• එක් කණ්ඩායමක් සදහා වාදන අංග 01 ක් පමණක් ඉදිරිපත් කල යුතුය.<br>• මුල් ගීතයේ හෝ වාදනයේ තනුවට හානි නොවන පරිදි ඊට උචිත ශිල්ප ක්‍රම යොදා ගනිමින්, නිර්මාණාත්මකව අංගය ඉදිරිපත් කල හැකිය.<br>• ස්වර ප්‍රස්ථාර පිළිබඳ අවබෝධය කෙරෙහි අවධානය යොමු කෙරේ. |

සාහිත්‍ය තරග අංශය

- සාහිත්‍ය නිර්මාණ කැමති ඕනෑම වස්තු විෂයක් පාදක කරගනිමින් නිර්මාණය කල හැකිය. නිර්මාණ තුලින් මානව ගුණධර්ම අභියෝගයට ලක් නොකළ යුතුය.
- පැහැදිලි අත් අකුරින් හෝ පරිගනකගත කර සෑම නිර්මාණයක්ම පිටපත් 03 කින් එවිය යුතුය.
- එක් තරග අංශයකින් උපරිම නිර්මාණ තුනක් (03) ක් ඉදිරිපත් කළ හැකිය.

| | | |
|---|---|---|
| 74 | නවකතා - සිංහල | • අත් පිටපත් තරගයකි. කවර නිර්මාණය සහ පෙරවදන් සහ පසුවදන් ඇතුලත්ව මුද්‍රණය සදහා පිළියෙල කල අංග සම්පූර්ණ අත් පිටපතක් විය යුතුය. |
| 75 | නවකතා - දමිළ | |
| 76 | නවකතා - ඉංග්‍රීසි | |
| 77 | කෙටිකතා - සිංහල | • මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය. |
| 78 | කෙටිකතා - දමිළ | |
| 79 | කෙටිකතා - ඉංග්‍රීසි | |

| | | |
|---|---|---|
| 80 | පද්‍ය රචනා - සිංහල | • කැමති ඕනෑම කාව්‍ය ආකෘතියකින් නිර්මාණ ඉදිරිපත් කළ හැකි අතර ඒවා මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය. |
| 81 | පද්‍ය රචනා - දමිළ | |
| 82 | පද්‍ය රචනා - ඉංග්‍රීසි | |
| 83 | ගීත රචනා - සිංහල | • තැටිගත කර මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කොකළ නිර්මාණයක් විය යුතුය. |
| 84 | ගීත රචනා - දමිළ | |
| 85 | ගීත රචනා - ඉංග්‍රීසි | |
| 86 | නිර්මාණාත්මක රචනා - සිංහල | • විවිධ ආකෘතියේ රචනා මේ යටතේ ඉදිරිපත් කළ හැකිය.<br>• වචන 1000 – 1500 අතර |
| 87 | නිර්මාණාත්මක රචනා - දමිළ | |
| 88 | නිර්මාණාත්මක රචනා - ඉංග්‍රීසි | |
| 89 | ළමා සාහිත්‍ය කෘති - සිංහල | • අත් පිටපත් තරගයකි. කවර නිර්මාණය සහ පෙරවදන් සහ පසුවදන් ඇතුලත්ව මුද්‍රණය සඳහා පිළියෙල කල අංග සම්පූර්ණ අත් පිටපතක් විය යුතුය. ළමා සාහිත්‍ය කෘතිවලදී අදාළ පිටකවරය මෙන්ම ඇතුලත චිත්‍ර ද ඇතුලක් කර තිබිය යුතුය. |
| 90 | ළමා සාහිත්‍ය කෘති - දමිළ | |
| 91 | ළමා සාහිත්‍ය කෘති - ඉංග්‍රීසි | |

ලියාපදිංචි අංකය

# ජාතික යෞවන සම්මාන තරගාවලිය - 2024

## ............................................... තරගය සඳහා අයදුම්පත්‍රය

(එක් තරගයක් සඳහා එක් අයදුම්පතක් භාවිතා කළ යුතුය)

වයස් සීමාව - වයස අවුරුදු 15 - 35 (උපන් දිනය 1989.08.15 දිනට පසු හා 2009.08.15 අතර )

01 සම්පූර්ණ නම : .....................................................................................

02 මුලකුරු සමග නම : .....................................................................................

03 ස්ථිර ලිපිනය : .....................................................................................

04 දුරකථන අංකය : .....................................................................................

05 උපන් දිනය : .....................................................................................

06 2024.08.15 දිනට වයස : .....................................................................................

07 ජාතික හැඳුනුම්පත් අංකය : .....................................................................................

08 දිස්ත්‍රික්කය :- .....................................................................................

09 සාහිත්‍ය තරගයක් නම් නිර්මාණයේ නම : .....................................................................................

ජාතික තරුණ සේවා සභාව විසින් සංවිධානය කරනු ලබන 2024 ජාතික යෞවන සම්මාන තරගයට මා විසින් ඉදිරිපත් කළ අයදුම්පත්‍රයේ කරුණු සත්‍ය බවත් මෙම තරගයේ දී ජාතික තරුණ සේවා සභාවේ නීති රෙගුලාසි හා තීරණ වලට එකඟ වන බවත් විනිශ්චය මණ්ඩලය විසින් ලබා දෙන තීරණය පිළිගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :- ....................................

........................................
අයදුම්කරුගේ අත්සන

## ජාතික යෞවන නාට්‍ය තරගාවලිය - 2024

ජාතික තරුණ සේවා සභාව මගින් වාර්ෂිකව සංවිධානය කොට පවත්වනු ලබන ජාතික යෞවන නාට්‍ය තරගාවලිය මෙවරද 43 වන වරට පැවැත්වීමට කටයුතු යොදා ඇත. ජාතික යෞවන නාට්‍ය තරගාවලියේ නාට්‍ය නිර්මාණ 2 වන වටය ලෙස පළාත් මට්ටමින් විනිසුරු මණ්ඩලය නාට්‍ය නරඹා ඇගයීමට ලක්කොට අවසන් වටය සඳහා සුදුසු නාට්‍ය/කෙටි නාට්‍ය තෝරා ගැනීම සිදුවේ.

යෞවන නාට්‍ය තරගාවලිය - 2024 පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියාත්මක විය යුතුය.

<u>ජාතික යෞවන නාට්‍ය තරගාවලියට අදාළ පොදු උපදෙස්</u>

1.1 යෞවන නාට්‍ය උළෙලේ ගුණාත්මක භාවය රඳවා ගනිමින් ආධුනික නිර්මාණකරුවන් ජාතික තලය දක්වා රැගෙන එමින් අංකුර නිර්මාණකරුවන් දිරිගැන්වීම සඳහා විනිසුරු මණ්ඩලය පළාත් වශයෙන් ගොස් නාට්‍ය නිෂ්පාදන නරඹා අවසන් වටයට වඩාත් උසස් නාට්‍ය තෝරා ගැනීමට තීරණය කර ඇත.

1.2 2024 යෞවන නාට්‍ය තරගාවලිය සඳහා ඉදිරිපත්විය හැකි වයස අවුරුදු 15 - 35 ත් අතර වේ.සියළුම ශිල්පීන් නාට්‍ය පිටපත් භාර ගන්නා අවසන් දිනය වන 2024/08/15 වන දිනට අවුරුදු 15- 35 ත් අතර වීම. ( 1989.08.15 දිනට පසු හා 2009.08.15 දිනට පෙර උපන් අය විය යුතුය.

1.3 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය - 2024 අගෝස්තු 15 වේ.
ජාතික යෞවන නාට්‍ය තරගාවලිය සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් දිගු නාට්‍ය හා කෙටි නාට්‍ය තරගාවලියක් වශයෙන් පැවැත්වේ.

1.4 දිගු නාට්‍ය හා කෙටි නාට්‍ය අංශය සඳහා ඉදිරිපත් කරන නිර්මාණ පැහැදිලි අත් අකුරින් හෝ පරිගණක අකුරු වලින් සකස් කර එක් නිර්මාණයකින් පිටපත් 01 බැගින් ඉදිරිපත් කළ යුතුය. දිගු නාට්‍ය පැය 1 ත් පැය 2 ½ ත් අතර ද කෙටි නාට්‍ය විනාඩි 15 ත් - 30 ත් අතර ද විය යුතුය. (විස්තර අයදුම් පත්‍රයේ සඳහන් කළ යුතු අතර නාට්‍ය පිටපතෙහි රචකයාගේ විස්තර සහ නාට්‍යයේ නම සඳහන් කල යුතුය.)

1.5 ජාතික තරුණ සේවා සභාව විසින් පනවන කොන්දේසිවලට අනුව නාට්‍ය නිර්මාණය ඉදිරිපත් කළ යුතුය. නාට්‍ය නිර්මාණය තුළ මත්ද්‍රව්‍ය මත්පැන් භාවිතය සජීවීව ප්‍රදර්ශනය කෙරෙන හෝ විවිධ ජාතික සංස්කෘතික අනන්‍යතා අභියෝගයට ලක් කෙරෙන දර්ශන ඇතුලත් කිරිම නොකළ යුතුය.

1.6 ජාතික තරගයට සුදුසුකම් ලබන කෙටි නාට්‍ය හා දිගු නාට්‍ය සඳහා ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලයේ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

1.7 අයදුම්කරුගේ ස්ථිර පදිංචි පළාත තුල නාට්‍ය ප්‍රදර්ශනය කල යුතුය. එසේ නොහැකි වූ අවස්ථාවක දී තරුණ සේවා සභාව විසින් තීරණය කරනු ලබන දිනයක දී කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථානයක දී නාට්‍ය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කල යුතුය.

1.8 සියලුම අයදුම්කරුවන් ජාතික තරුණ සේවා සභාවේ නාට්‍ය තරගාවලිය සඳහා නිකුත් කරනු ලබන චක්‍රලේඛයට යටත්ව නිකුත් කර ඇති අයදුම්පත්‍රය මගින් පමණක් අයදුම් කල යුතු අතර වෙනත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.9 නාට්‍ය සඳහා අයදුම් කරන සියලු අයදුම්කරුවන් තම අයදුම්පත සමග නාට්‍ය/කෙටි නාට්‍ය පිටපත ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංස්කෘතික අංශය වෙත නියමිත දිනට පෙර ගෙනවිත් භාරදීම හෝ සහකාර අධ්‍යක්ෂ (සංස්කෘතික), ජාතික තරුණ සේවා සභාව, අංක 65, හයිලෙවල් පාර, මහරගම. ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතුය.

1.10 පළාත් වශයෙන් නාට්‍ය වේදිකාගතවන අවස්ථාවේදී නාට්‍යයට සම්බන්ධ සියලුම ශිල්පීන්ගේ අනන්‍යතාව පරීක්ෂා කරන බැවින් අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඊට අදාළ ජාතික හැඳුනුම්පත, තැපැල් හැඳුනුම්පත, ගුවන් ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය ඉදිරිපත් කල හැකි අතර එසේ නොමැති විට උප්පැන්න සහතිකයෙහි මුල් පිටපත සමග අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, විහාරාධිපති හෝ රජයේ පිළිගත් විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කරන ලද පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

1.11 ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අඩුපාඩු සහිත අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.12 සම්මාන උළෙලෙන් පසුව වුවද කිසියම් වංචනික ක්‍රියාවක් කළ බවට ඔප්පු වුවහොත් සම්මාන සහතිකය සහ ත්‍යාග මුදල අවලංගු කිරීම , ඉදිරි යෞවන නාට්‍ය තරග සහභාගීත්වය වසර 05 ක කාලයකට අවලංගු කිරීම ආදී වශයෙන් ජාතික තරුණ සේවා සභාවේ නීති රෙගුලාසි හා තීරණවලට එකග විය යුතුය.

- තරගාවලිය සම්බන්ධ තොරතුරු සහ චක්‍රලේඛ උපදෙස් www.nysc.lk වෙබ් අඩවිය මගින් ලබා ගත හැකිය

02. ජාතික යෞවන නාට්‍ය තරගාවලියට අදාළ තරග අංශ

I. කෙටි නාට්‍ය සිංහල මාධ්‍ය
II. කෙටි නාට්‍ය දෙමළ මාධ්‍ය
III. දිගු නාට්‍ය සිංහල මාධ්‍ය
IV. දිගු නාට්‍ය දෙමළ මාධ්‍ය
V. කෙටි නාට්‍ය ඉංග්‍රීසි මාධ්‍ය
VI. දිගු නාට්‍ය ඉංග්‍රීසි මාධ්‍ය

ඉහත සම්මාන ප්‍රදානයේ දී එක් එක් ඇගයීම් අංශයන් සදහා ඇගයීමට ලක්වන්නේ එක් අයෙක් පමණි. තරග අංශ හා අනුෂාංගික අංශ ඇගයීමේදී කිහිප දෙනෙකු ඉදිරිපත් වී නම් සදහන් වුවද පිරිනමනුයේ එක් සම්මානයක් පමණි.

03 ජාතික යෞවන නාට්‍ය උළෙල

2024 ජාතික යෞවන නාට්‍ය උළෙලේ පළාත් තරග 2024 සැප්තැම්බර් / ඔක්තෝබර් මාසවල සහ අවසන් වටය නාට්‍ය තරගය 2024 නොවැම්බර් මස තුල දී පැවැත්වීමට අපේක්ෂිතය.

ලියාපදිංචි අංකය

<u>ජාතික යෞවන නාට්‍ය තරගාවලිය - 2024</u>

<u>..............................................තරගය සඳහා අයදුම්පත</u>
(එක් තරගයක් සඳහා එක් අයදුම්පතක් භාවිත කල යුතුය)

වයස් සීමාව   වයස අවුරුදු 15-35 (උපන් දිනය 1989.0**8.15**දිනට පසු හා **2009**.0**8.15** දිනට පෙර විය යුතුය

තරග අංශ **-**   සිංහල / දමිළ /ඉංග්‍රීසි
කෙටි නාට්‍ය / දිගු නාට්‍ය
ස්වතන්ත්‍ර/අනුවර්ථන/පරිවර්ථන
(අනවශ්‍ය වචන කපා හරින්න)

01 නාට්‍ය නිෂ්පාදකගේ සම්පූර්ණ නම - ..........................................................................................

02 මුලකුරු සමග නම - ..........................................................................................

03 ස්ථිර ලිපිනය - ..........................................................................................

04 දුරකථන අංකය - ..........................................................................................

05 උපන් දිනය - ..........................................................................................

06 2024.08.15 දිනට වයස - ..........................................................................................

07 ජාතික හැඳුනුම්පත අංකය -..........................................................................................

08 දිස්ත්‍රික්කය -..........................................................................................

09 පළාත -..........................................................................................

10 නිර්මාණයේ නම - ..........................................................................................

යෞවන සම්මාන නාට්‍ය උළෙල සඳහා නාට්‍ය අංශයෙන් හෝ කෙටි නාට්‍ය අංශය සඳහා සිංහල, දමිළ,මාධ්‍යයෙන් ඔබ ඉදිරිපත් කරන පිටපත ( ස්වතන්ත්‍ර- පරිවර්ථන කුමක් වුවත්) එම නිර්මාණය තමන්ගේම ස්ව නිර්මාණයක් බවත්, නිශ්චිත වයස් සීමාව ඉක්මවා ඇති, විශ්ව විද්‍යාල,වෙනත් ශාස්ත්‍රාලීය අධ්‍යාපන ආයතනයන්හි, සමිති සංගම් හා වෙනත් කිසිඳු පුද්ගලයෙකුගේ නිර්මාණාත්මක සම්බන්ධතාවයක් මෙම නිර්මාණයට නොමැති බවට සහතික වෙමි.

ජාතික තරුණ සේවා සභාව විසින් සංවිධානය කරනු ලබන 2024 ජාතික යෞවන නාට්‍ය තරගයට මා විසින් ඉදිරිපත් කල අයදුම්පත්‍රයේ කරුණු සත්‍ය බවත්, මෙම තරගයේ දී ජාතික තරුණ සේවා සභාවේ නීති රෙගුලාසි හා තීරණවලට එකඟ වන බවත් විනිශ්චය මණ්ඩලය විසින් ලබා දෙන තීරණය අවසන් තීරණය ලෙස පිළිගන්නා බව මෙයින් ප්‍රකාශ කරමි.

දිනය **-** ..........................................   ..........................................
නාට්‍ය නිෂ්පාදකගේ අත්සන